# රාජකීය මංගල්‍යය







**මෑ**ත කාලයේදී ලොව සිදුවූ වඩා ගාම්භීර වූත්, සම්ප්‍රදායානුකූලවූත්, උත්සවශ්‍රීයෙන් ඇළලුනාවූත් මහා රාජකීය විවාහ මංගල්‍යය අප්‍රියෙල් **29** වන දින ලන්ඩනයේ දී පැවැත්විණ.

බ්‍රිතාන්‍ය කිරුළට හිමිකම් ඇති දෙවන තැනැත්තා වන විලියම් කුමරුගේ සහ කැතරින් (කේට්) මිඩ්ල්ටන් මෙනෙවිය අතර සිදුවූ විවාහය බ්‍රිතාන්‍ය රාජ්‍ය නායිකාව වන එළිසබෙත් මහරැජිණ ප්‍රධාන රාජකීය පවුලටද, බ්‍රිතාන්‍ය රජයටද, පොදුරාජ්‍ය මණ්ඩලයට ද වැදගත් වූවා සේම බ්‍රිතාන්‍ය වැසියෝ ද මහත් ඉහළින් ප්‍රීති ප්‍රමෝදයට පත්වූහ.

විශ්වවිද්‍යාල උපාධියක් ලත් එකම රාජකීයයා වන විලියම් කුමරුගේ විවාහය බොහෝ කාරණා නිසා විශේෂත්වයක් දැරුවේය. මනාලිය කේට් ට කිසිදු රාජකීය හෝ ආදිපාද හෝ රදළ හෝ සබඳකම් නොවීය. ඇය සාමාන්‍ය පවුලක තරුණියකි. විවාහයට දින කීපයකට පෙර සාමාන්‍ය තරුණියක ලෙස සාප්පු ගොස් ජනතාව අතර හිඳ ඇය ඇඳුම් පැළඳුම් මිළදී ගත්තා ය. රජකුමරෙකු හා විවාහවීමට ලැබීම ඔබේ පෙර වාසනාවක් නොවේදැයි මාධ්‍යවේදියෙකු ඇසූවිට ඇය නොපැකිල පිළිතුරු දුන්නේ මා වැනි සාමාන්‍ය කෙනෙකු හා විවාහවීමට ඔහු ද(විලියම්කුමරුද) වාසනාවන්ත විය යුතු බව ය.

විවාහවීමට පෙර දින විවාහ උත්සවය නැරඹීමට පැමිණි පිරිස් රාත්‍රි ලැගුම්ගෙන සිටි ස්ථානවලට ගොස් විලියම් කුමරු ඔවුනට තම සුහදතාව පළකළේය. මංගල්‍යයට යොදාගත් මල්කුමරුන් හා කුමරියන් (flower girls & page boys ) අතර විලියම් කුමරුගේ සේවිකාවගේ (nanny) හා පුද්ගලික ලේකම්වරයාගේ ( Private Secretary) දරු සිහිත්තෝද වූහ. උත්සවයට ආරාධනා ලැබූ 1900 ක් දෙනා අතර මතභේදයන්ට ලක්වූ ඥාතීහුද, මිතුරෝද වූහ. රාජකීයයත්වය ද, රාජ්‍යතාන්ත්‍රිකභාවය ද, තානාපති සබඳතා ද සැලකිල්ලට ගෙන ආරාධනාපත්‍ර යවා තිබුණි. බ්‍රිතාන්‍ය තුළ ක්‍රියාකාරී ආගමික සංවිධානවල නායකයන්ටද ඇරැයුම් කර තිබුණු අතර, බෞද්ධ ජනතාව වෙනුවෙන් ආරාධනාව ලැබී තිබුණේ ලන්ඩන් විහාරාධිපති බෝගොඩ සීලවිමල නාහිමියන්ට ය.

බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන්, නියෝජ්‍ය අගමැති නික් ක්ලෙග්, හිටපු අගමැතිවරුන්-වන මාග්‍රට් තැචර් හා සර් ජෝන් මේජර් ද, කම්කරු පක්ෂ නායක එඩ් මිලිබෑන්ඩ් සහ කතානායක ජෝන් බර්කව් සහ තවත් කැබිනට් ඇමතිවරු ආරාධනා ලැබූ අය වූහ. හිටපු අගමැතිවරුන් වන ටෝනි බ්ලෙයාර් සහ ගෝර්ඩන් බ්‍රවුන් ට ආරාධනා කර තිබුණේ නැත. ඒ පිළිබඳව කම්කරුපක්ෂ නායකයාගෙන් තරමක අසතුටක් පළවිය. එය සමනය කිරීමට ලැබුණු පිළිතුර වූයේ ටෝනි බ්ලෙයාර් සහ ගෝර්ඩන් බ්‍රවුන් හට මේ වනතුරු රැජිණගෙන් ප්‍රභූ නම්බුනාමයන් (knight of the garter ) නොලැබීම නිසා ඔවුන්ට තැචර් සහ මේජර් දෙදෙනට මෙන් තාන්ත්‍රික තත්වයන් (protocol) නොමැති බවය. ඒ කෙසේ වෙතත් කම්කරු පක්ෂනායක එඩ් මිලිබෑන්ඩ් ට ආරාධනාකර තිබූ අතර, ඔහු මංගල උත්සවයටත් පසුව මාළිගයේ පැවැති භෝජන සංග්‍රහයටද සහභාගි වූයේය.

විලියම් කුමරු තම යුතුකම් ඉටුකිරීමේ චාරිත්‍ර විධි මනාව ප්‍රකට කරමින් තම හමුදා සගයන් කීප දෙනෙකුටද ඇරැයුම් කළේය. හමුදා විද්‍යාපීඨයේ ( Sand Hurst Military Academy ) කණ්ඩායම් භාරව සිටි නිලධාරියා 2007 දී ඇෆ්ඝනිස්ථානයේදී මියගොස් තිබුණු නිසා ඔහුගේ වැන්දඹු බිරිඳටද, තම සගයෙකු වූ ලුතිනන් හෝලි ඩයර් ඉරාක යුද්ධයේදී මියගිය බැවින් ඔහුගේ සොහොයුරියටද, සැරයන් කීත් බෙස්ට් හා කෝපරල් මාටින් කොම්ප්ටන් වැනි සාමාන්‍ය සොල්දාදුවන් කීප දෙනෙකුටද ආරාධනාකර තිබුණේ ය.

ඇමරිකානු ජනාධිපතිවරයාටද ආරා ධනා කරන්නට යෝජිතව තිබුණු නමුත් ඔහු මේ මස බ්‍රිතාන්‍යයේ නිල සංචාරයකට එන බැවින් ආරාධනා පත්‍රය යවා නොතිබුණි.

මෙම විවාහ මංගලෝත්සවයට බ්‍රිතාන්‍ය රජ පවුලද, බ්‍රිතාන්‍ය රජයද, කේට් මිඩ්ල්ටන් පවුලද වියහියදම් දරා ඇත. මේ සියළු දේ සඳහා විවිධ අන්දමින් වැයවූ ගණන පවුම් මිලියන 10 ක් ද ඉක්මවා ඇති බව කියති.

මෙම උත්සවය සඳහා පොලිස් නිලධාරීන් 5000ක් ද, අශ්වාරෝහක හටයින් 200 ක් ද රාජකාරියේ යො දවා තිබුණි. ලන්ඩන් නුවරට රැස්වූ මිලියනයක් පමණ ජනතාවට වැසිකිලි පහසුකම්, ආහාරපාන සේවා යනාදිය ද මනාව සැළසුම්කර තිබුණේය. ලෝකයේ විවිධ රටවලින් සහ මහා බ්‍රිතාන්‍යයේ මාධ්‍ය ආයතන වලින් පැමිණි මාධ්‍යකරුවෝ 8500 ක් මෙම අපූර්වතම ගාම්භීර විවාහ උත්සවය ලොවට ප්‍රචාරය කර හැරියහ. පැපරාසි මාධ්‍යකරුවන් නිසා ඩයනා කුමරියට මෙන්ම රාජකීය පවුලටත් සිදුවූ විනාශය මෙනෙහි කළ බලධාරීන් මෙවර මාධ්‍යය මනාව හසුරුවා තිබුණි. එමෙන්ම සියළු මාධ්‍යකරුවන් ඩයනාකුමරියට සිදුවූ විනාශය අවබෝධකර ගනිමින් අනිසි මාධ්‍ය දඩයමින් බැහැරව හුදෙක්ම විවාහ මංගල්‍යයේ සුන්දරත්වයත්, එහි ඓතිහාසික පෙළගැස්මත්, ගාම්භීරත්වයත් නවීන තාක්ෂණයට කවා බිලියනයක් පමණ වූ පාඨක ජනතාවට ඉතා මනෝඥ ලෙස ඉදිරිපත්කර තිබුණේය.

***ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි***

♦ ***මේජර් වී. බී. කරුණාරත්න***

**Major V. B. Karunaratne**

**Oxford UK**



## ඇමති චම්පික හිස මුඩුකර භාවනාකරන්නට යයි

**ජා**තික හෙළ උරුමයේ ලේකම් සහ බලශක්ති ඇමතිවරයා වන පාඨලී චම්පික රණවක මහතා ඇතුළු ජාතික හෙළ උරුමයේ සාමාජිකයින් විශාල පිරිසක් ළඟ එන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් සති කීපයක් සම්පූර්ණයෙන් හිස මුඩුකර භාවනානුයෝගීව සිටින්නට අදහස් කොට කළුබොඩගම විපස්සනා භාවනා මධ්‍යස්ථානයට යාමට පෙර රාජගිරියේ සදහම් අසපුවට ගොස් අතුරලියේ රතන හිමියන් හමුවූ අවස්ථාවයි මේ.



## බොක්සිං ශූර මංජුට රන්පදක්කම අහිමි වේ

**තහ**නම් උත්තේජක ගැනීමේ චෝදනාවට ලක්වූ පොදු රාජ්‍ය මණ්ඩලයීය බොක්සිං රන් පදක්කම් ලාභී මංජු වන්නිආරච්චි මැලේසියාවේ ක්වාලාලාම්පූර් නුවරදී අද (8) පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා අධිකරණය ඉදිරියේ කරුණු දැක්වීමෙන් පසුව අධිකරණය ඔහු වරදකරු ලෙස නියම කළාය. එම නියමයත් සමග මංජු සතුව තිබූ රන් පදක්කම අවසන් තරගයේදී පරාජිතයා ව වේල්ස්හි ෂෝන් මැක්ගොල්ඩ්ක්ට පිරිනැමෙනු ඇත.

